# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


අංක 2,049 - 2017 දෙසැම්බර් මස 08 වැනි සිකුරාදා - 2017.12.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | 1196 |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | 1197 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 1197 |


*සැ. යු.* - (i) ශ්‍රී නාථ අභස්ථාන ජාත්‍යන්තර බෞද්ධ භාවනා මධ්‍යස්ථාන කාර්ය සාධන සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2017 නොවැම්බර් මස 17 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) මෝහන් ලංකා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2017 නොවැම්බර් මස 17 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2017 දෙසැම්බර් මස 29 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 දෙසැම්බර් මස 15 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


1195- B 081232— 353 (2017/12)
D 1 -

# දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම්

## උතුරුමැද පළාත්බද මහාධිකරණය - පොළොන්නරුව

### කාලය ඉකුත් වී ඇති නඩු වාර්තා විනාශ කිරීම

මෙම අධිකරණයේ පවරන ලදුව, අවසන් කර වසර 05කට වඩා පැරණි පහත උපලේඛනයේ අංක සඳහන් නඩු වාර්තා විනාශ කිරීම සඳහා ලේඛනගත කර 2018.03.01 වැනි දිනෙන් පසුව මෙම අධිකරණ භූමියේ දී පුළුස්සා විනාශ කිරීමට කටයුතු සූදනම් කර ඇත.

02. මෙම නඩු සම්බන්ධයෙන් යම් පාර්ශවකරුවෙකුට නඩු වාර්තාවක ලියවිල්ලක් හෝ පිටපතක් ලබා ගැනීමට අවශ්‍ය වේ නම් 2018.03.01 දිනට පෙර පැමිණ මෙම අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරියගෙන් ලබා ගන්නා ලෙසට මෙයින් දන්වා සිටිමි.

එච්. පී. ජී. එන්. රණවීර,
මහාධිකරණ විනිසුරු - පොළොන්නරුව.

2017 නොවැම්බර් මස 15 වැනි දින,
පොළොන්නරුව මහාධිකරණයේ දී ය.

**උපලේඛනය - 1**

| | | | | | |
|---|---|---|---|---|---|
| **එච්.සී.** | එච්.සී. 378/2006 | එච්.සී. 69/2009 | ඇප 04/2012 | ඇප 31/2012 | අභි. 11/2009 |
| | එච්.සී. 399/2006 | එච්.සී. 74/2009 | ඇප 05/2012 | ඇප 33/2012 | අභි. 29/2009 |
| එච්.සී. 08/2006 | එච්.සී. 09/2007 | එච්.සී. 75/2009 | ඇප 06/2012 | | අභි. 01/2010 |
| එච්.සී. 17/2006 | එච්.සී. 27/2007 | එච්.සී. 76/2009 | ඇප 07/2012 | **ප්‍රතිශෝධන** | |
| එච්.සී. 26/2006 | එච්.සී. 30/2007 | එච්.සී. 77/2009 | ඇප 08/2012 | | **රිට්** |
| එච්.සී. 28/2006 | එච්.සී. 48/2007 | එච්.සී. 01/2010 | ඇප 09/2012 | ප්‍රති. 01/2010 | |
| එච්.සී. 52/2006 | එච්.සී. 57/2007 | එච්.සී. 06/2010 | ඇප 10/2012 | ප්‍රති. 05/2010 | රිට්. 01/2006 |
| එච්.සී. 72/2006 | එච්.සී. 63/2007 | එච්.සී. 27/2010 | ඇප 11/2012 | ප්‍රති. 01/2011 | රිට්. 03/2006 |
| එච්.සී. 108/2006 | එච්.සී. 71/2007 | එච්.සී. 55/2010 | ඇප 12/2012 | ප්‍රති. 02/2011 | රිට්. 05/2006 |
| එච්.සී. 125/2006 | එච්.සී. 72/2007 | එච්.සී. 62/2010 | ඇප 13/2012 | ප්‍රති. 05/2011 | රිට්. 08/2006 |
| එච්.සී. 128/2006 | එච්.සී. 09/2008 | එච්.සී. 75/2010 | ඇප 14/2012 | ප්‍රති. 06/2011 | රිට්. 11/2006 |
| එච්.සී. 150/2006 | එච්.සී. 10/2008 | එච්.සී. 79/2010 | ඇප 15/2012 | ප්‍රති. 08/2011 | රිට්. 12/2006 |
| එච්.සී. 163/2006 | එච්.සී. 11/2008 | එච්.සී. 82/2010 | ඇප 16/2012 | ප්‍රති. 09/2011 | රිට්. 13/2006 |
| එච්.සී. 176/2006 | එච්.සී. 23/2008 | එච්.සී. 88/2010 | ඇප 17/2012 | ප්‍රති. 10/2011 | රිට්. 14/2006 |
| එච්.සී. 178/2006 | එච්.සී. 24/2008 | එච්.සී. 92/2010 | ඇප 18/2012 | ප්‍රති. 01/2012 | රිට්. 01/2008 |
| එච්.සී. 241/2006 | එච්.සී. 27/2008 | එච්.සී. 96/2010 | ඇප 19/2012 | ප්‍රති. 02/2012 | රිට්. 02/2008 |
| එච්.සී. 260/2006 | එච්.සී. 28/2008 | එච්.සී. 100/2010 | ඇප 20/2012 | ප්‍රති. 03/2012 | රිට්. 05/2008 |
| එච්.සී. 262/2006 | එච්.සී. 55/2008 | එච්.සී. 103/2010 | ඇප 21/2012 | ප්‍රති. 04/2012 | රිට්. 06/2008 |
| එච්.සී. 270/2006 | එච්.සී. 56/2008 | එච්.සී. 104/2010 | ඇප 22/2012 | ප්‍රති. 05/2012 | රිට්. 02/2009 |
| එච්.සී. 288/2006 | එච්.සී. 57/2008 | එච්.සී. 107/2010 | ඇප 23/2012 | ප්‍රති. 06/2012 | රිට්. 09/2009 |
| එච්.සී. 306/2006 | එච්.සී. 60/2008 | | ඇප 24/2012 | ප්‍රති. 07/2012 | රිට්. 10/2009 |
| එච්.සී. 312/2006 | එච්.සී. 28/2009 | **ඇප අයදුම්පත්** | ඇප 25/2012 | ප්‍රති. 14/2012 | රිට්. 11/2009 |
| එච්.සී. 325/2006 | එච්.සී. 42/2009 | | ඇප 26/2012 | | රිට්. 12/2009 |
| එච්.සී. 339/2006 | එච්.සී. 51/2009 | ඇප 53/2011 | ඇප 27/2012 | **අභියාචනා** | රිට්. 13/2009 |
| එච්.සී. 343/2006 | එච්.සී. 53/2009 | ඇප 01/2012 | ඇප 28/2012 | | රිට්. 16/2009 |
| එච්.සී. 352/2006 | එච්.සී. 54/2009 | ඇප 02/2012 | ඇප 29/2012 | අභි. 02/2007 | රිට්. 02/2012 |
| එච්.සී. 373/2006 | එච්.සී. 55/2009 | ඇප 03/2012 | ඇප 30/2012 | අභි. 06/2009 | රිට්. 03/2012 |

# පිස්කල් විකිණීම්

## මහව දිසා අධිකරණයේ දී ය

කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවතේ, අංක 75 දරන ස්ථානයේ ප්‍රධාන කාර්යාලයේ පිහිටි මහජන බැංකුව,

*නඩු අංකය :* 644/උකස්
*ඇස්කීසි අංකය :* 02/16

......................*පැමිණිලිකරු.*

*එදිරිව*

යාපා හාමි මුදියන්සේලාගේ රූපා ඉන්දුමතී,
අශෝකා ස්ටෝර්ස්, නිතලව, මකුලෑව,
දැනට-අප්සරා බියුටි සැලූන් සහ ටේලර්ස්,
මැටිකුඹුර හන්දිය, පොල්ගහවෙල.

...........................*විත්තිකාරිය.*

ඉහත අංක දරන නඩුවේ වර්ෂ 2014ක් වූ අගෝස්තු මස 25 දිනැති සමථ තීන්දු ප්‍රකාරව විත්තිකාරිය විසින් පැමිණිලිකාර මහජන බැංකුව වෙත රුපියල් හාරලක්ෂ විසිනමදහස් අටසිය තිස්පහයි ශත තිස්හයක (රු. 4,29,835.36) මුදලක් ගෙවීමට එකඟ වීමෙන් පසුව එකී සමථය කඩකර ඇති හෙයින්, වර්ෂ 2015 මාර්තු මස 21 දින තහනමට ගන්නා ලද පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන දේපලෙහි ඉහත සඳහන් විත්තිකාරියට ඇති අයිතිවාසිකම් හා හිමිකම් වර්ෂ 2017ක් වූ දෙසැම්බර් මස 27 වැනි දින පෙ. ව. 11.30ට හෙට්ටිගම නමැති ගමේ පිහිටියා වූ බෝගහයාය නමැති ඉඩමෙහි දී, ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වන්නි හත්පත්තුවේ 45, බස්නාහිර කෝරළේ, හෙට්ටිගම නැමැති ගමේ පිහිටි ''බෝගහයාය'' නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. පී. ජී. කරුණානායක මහතා විසින් 2009.08.17 දින මැන සාදන ලද කු/අනු රේඛන/2009/80 දරන පිඹුරේ සඳහන් කැබලි අංක 60 දරන ඉඩමට මායිම්,

*උතුරට :* ලොට් අංක 64 ද,
*නැගෙනහිරට :* ලොට් අංක 63 සහ 61 ද,
*දකුණට :* ලොට් අංක 108 දරන බිං පොකුණ විහාරයේ සිට නිතලවට යන ගම්සහා පාර ද,
*බටහිරට :* ලොට් අංක 59 ද,

යන මෙකී මායිම් තුළ පිහිටි අක්කර දෙකයි පර්චස් හතයි දශම පහක (අක්කර 02, රූ. 00, පර්චස් 7.5) විශාල ඉඩම සහ ඒ තුළ වූ ගහකොළ පලතුරු, ගොඩනැගිලි ඇතුළු සියලුම දෑ ද සමඟ වේ.

රෙජිස්ට්‍රාර්/පිස්කල්,
දිසා අධිකරණය - මහව.

12-93

---

# විවිධ දැන්වීම්

## ඡායා පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

*නාමල් රාජපක්ෂ වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ* අංක 48 (1) දරන ස්ථාවර නියෝගය යටතේ "ඡායා පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි'', යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණු වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථ වලින් යුක්ත වන්නා වූ එකී පදනම සංස්ථාගත කිරීමයි :-

*(අ)* විශේෂ අවශ්‍යතා ඇති දරුවන්ගේ අධ්‍යාපන කටයුතුවලට ආධාර කිරීම ;

*(ආ)* විශේෂ අවශ්‍යතා ඇති දරුවන් සිටින මධ්‍යස්ථානවලට ආධාර අනුග්‍රහය දැක්වීම ;

*(ඇ)* නොමිලේ වෛද්‍ය කඳවුරු පැවැත්වීම,

යනාදිය වේ.

නාමල් රාජපක්ෂ,
පාර්ලිමේන්තු මන්ත්‍රී.

12-47

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට ... ... ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

## * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | **පිටපතක මිල** | **තැපැල් ගාස්තුව** |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2017 වර්ෂය** | | | |
| **දෙසැම්බර්** | 2017.12.08 | සිකුරාදා | 2017.11.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.12.15 | සිකුරාදා | 2017.11.30 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2017.12.22 | සිකුරාදා | 2017.12.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.12.29 | සිකුරාදා | 2017.12.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| | | | **2018 වර්ෂය** | | | |
| **ජනවාරි** | 2018.01.05 | සිකුරාදා | 2018.12.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.01.12 | සිකුරාදා | 2018.12.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.01.19 | සිකුරාදා | 2018.01.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.01.26 | සිකුරාදා | 2018.01.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| **පෙබරවාරි** | 2018.02.02 | සිකුරාදා | 2018.01.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.02.09 | සිකුරාදා | 2018.01.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.02.16 | සිකුරාදා | 2018.02.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.02.23 | සිකුරාදා | 2018.02.09 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.).*

2017 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.